## ඔහොම යමු

ස්කැට් සංවිධානෙන් කරපු නාට්‍ය උත්සවය බලන්න ගියා. මුලින් හිතුවේ ඒක නාට්‍ය තරගයක් කියලයි. ඒක එහෙම උන එක හොඳයි තරගයක් නොවී. මේ අගය කළ යුතු වැඩක්. මාලනී ජයසිංහ මහත්මිය සිහි කරමින් කරන මේ උත්සවයට තිබුණු ජන සහභාගිත්වය මවිත කරවන සුලුයි. ශලාව සම්පූර්ණයෙන්ම පිරී තිබුණා. එහෙම වැඩකට මිනිස්සු එකතු වෙලා ඉන්නවා දකින එකත් සතුටක්. ඇරත් ආධුනික නාට්‍ය



කරුවන්ගේ වැඩකට. පිබිදෙන්න උත්සාහ කරන නවකයන්ගෙ උත්සාහයකට අත දෙන්න ස්කැට්ස් දරන මේ වැඩේට අපෙත් සහයෝගය දෙනවා බොක්කෙන්ම.

පෙන්නපු නාට්‍ය ගැන විචාරයක් දෙන්න තරම් පට්ට පොරක් නෙවි චූටි මල්ලි. ඒත් ඉතින් ලංකාවේදි නාට්‍ය බලලා ඒ ගැන කියවලා තියෙන නිසා අපේ ඇගෙත් පොඩ්ඩක් වගේ නාටය රසවින්දනය තැවරිලා තියෙනවා. ඒක නිසයි කියන්නේ මේ විදිහට එදා නාට්‍ය බලපු මට හිතුණෙ නලුවෙක් වෙනවා කියන්නේ කොයි තරම් අමාරු ගේමක්ද කියන එක. වේදිකාව කියන්නෙ කැරමාව ඉස්සරහ ඉන්නවා වගේ නෙවෙයිනෙ.

අපේ මෙල්බන් පුරවරයේ මලක් දෙකක් පිපිලා තියෙනවා තමයි. ඒත් මේ පරපුරට තව බොහෝ දුර යන්න තියෙන බව් මයි පෙනුණේ. කමක් නැහැ. ඔහොම යමු. ස්කැට්ස් ඔයාලගෙ පිටිපස්සෙන් ඉඳියි.

අන්තිමට කියන්න හිතුණේ නාට්‍ය බලනවා කියන්නෙ රස විඳිනවා කියන්නෙ අභ්‍යාසයක් කියන එක. මේ නරඹන්නන් බොහෝ අය දුර බැහැර ඉඳන් කැප වෙලා ආව අයනෙ. ඒ අයගෙ මහන්සිය යන්න තේ එකක්වත් නොමිලේ දෙන්න බලන්න. දැන් තියෙන කිසිම උත්සවයක තේ එකක් දීලා සල්ලි ගන්නෙ නැහැ. මේක රසික ජනතාව වෙනුවෙන් කරන අහිංසකම අහිංසක ඉල්ලීමක්.

## නියමයි දිල්රුක්ෂි

ශ්‍රී ලංකාවේ සමාජ සහජීවන ඇමති මනෝ ගනේෂන් එක්ක හොඳ ඉන්ටවිව් එකක් කළා SBS එකේ සිංහල සේවයෙ දිල්රුක්ෂි අක්කා. ඒක අහගෙන ඉන්නකොට මට මාර ලැජ්ජාවක් අවා. අපේ දෙවන භාෂාව සම්බන්ධයෙන් අපේ ඇති දැනුම ගැන. ඊට පස්සෙ මාර සතුටක් ඇතිඋනා ගනේෂන් ඇමති තුමා දිල්රුක්ෂි අක්කා සිංහලෙන් අහපු ප්‍රශ්න වලට සිංහලෙන් උත්තර දුන්න ආකාරය ගැන.

ඒක ජාතික ප්‍රශ්නය ගැන කතාවක්. එහිදී එහු දුන්න උත්තර සරළයි. පැහැදිළියි. ඔහු සිය ජාතිය ගැන නොසළකා රටේ ඒකීය භාවය වෙනුවෙන් තර්ජන මැද පෙනී සිටින්නෙක්. ඔහු තුළ අඩුපාඩු කම් නැතුව



නොවෙයි. එහෙත් රටේ ඒකීය භාවය වෙනුවෙන් පෙනී සිටින මනෝ ගනේෂන් - සුමන්දිරන් - අනන්ද සංගරී වැනි මිනිසුන් අප ආර්සා කරගත යුතුයි. කවුරැ මොනව කිව්වත් ඔවුන් කියන දේ වල සාධාරණයක් තියෙනවා. උදාහරණයක් ලෙස මනෝ ගනේෂන් ඇමතිතුමාගෙ උතුරේ ඉඩම් ප්‍රශ්නයේ ඔහු ගෙනෙන තර්කය බලන්න. හම්බන්තොට වරාය අවට සංවර්ධනය සඳහා ඉඩම් රජයට පවරාගෙන කටයුතු කිරීමට ඉඩම් හිමියොත් ඒ ප්‍රදේශයේ දේශපාලනඥයිනුත් දැන් විරෝධය පානවා. ඒ වෙනුවෙන් සටන් කරනවා. උතුරේ යුද්ධ නිසා රජයට පවරාගත් ඉඩම් යුද්ධය අවසානයට පසු නැවත ඉල්ලාසිටීම රට බෙදීමක් ලෙස අර්ථ ගන්වන එක සාධාරණ වෙන්නේ කොහොමද? යුක්තිය හා සාධාරණය උතුරට හා දකුණට එකම විය යුතුයි. ඒ තර්කය හරිය කියන එක තමයි චූටි මල්ලිට හිතෙන්නෙ.

මිනිසුන් පිටරටවල ගත කරන ජීවිත ගැනත් ලංකවේදී ජීවත්වන්නට උත්සාහ කරන ආකාරයත් කියන කාරණා දෙක ගැන ඔහුගේ තර්කය අපූරැයි. සිත් ගන්නා සුලුයි. පිටරටදී ෆෙඩරල් ලංකාවේදී ඒකීය.

මේක හොඳ සාකච්ඡාවක්. ඔබත් අහලා බලන්න. ජූලි 4 අගහරුවාදා SBS සිංහල සේවයේ.
http://www.sbs.com.au/yourlanguage/sinhalese/si/content/
ඔන්න මම ලින්ක් එකත් දැම්මා.

සියලුම දෙමළ මිනිසුන් කොටින් ලෙස අර්ථ ගන්වමින් ඊනියා දේශප්‍රේමී සංවිධාන ගොඩනගන්නන්ට ගැලපෙන උත්තර එහි තිබෙනවා. මා මෙය වැදගත් කොට සළකන්නෙ ඔඩු දුවා ඇති ප්‍රශ්නයක් විසඳා ගැනීමේදී මෙවැනි මාධ්‍යස්ථ මිනිසුන් ඉතා වැදගත් නිසා.

## සමාවෙන්න කුරුප්පු අංකල්

කුරුප්පු අංකල් ලෙස අප ඇමතූ ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතා සඳහටම අපෙන්



වෙන්වුණා. ඔහු ගැනත් ඔහුගේ නිර්මාණ කාර්යයන් ගැනත් දැන් ඇති පදම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල පළවුණ නිසා මමත් ඔහු ගැන ලියන්න යන්නෙ නැහැ. කෙටියෙන්ම මෙච්චරයි. ඒ හිස්තැන කිසිදාක පිරවෙන්නෙ නැහැ. මම මේ සටහන තබන්නෙ ඔහුගේ වියෝවෙන් ඇතිවුණ වේදනාවටත් වඩා කණගාටුවකින්. හා දැඩි කෝපය මුසුවුණ හැගීමකින්. ඔහුගෙ අවුරුදු 89ක් වන ජීවිතයේ හතරන් තුන් පංගුවකට වඩා වැය කළේ ලිවීම වෙනුවෙන්. එයිනුත් දශක තුනකට ආසන්න කාලයක් මෙරට ශ්‍රී ලාංකිකයන්ගේ සාහිත්‍ය හා විචාර ඥානය ගොඩනැගීම වෙනුවෙන් . ඔහු ඒ සඳහා දැරූ අපරිමිත උත්සාහයේ කිසිදු ප්‍රතිඵලයක් තිබේදැයි මට හිතුණේ ඔහුගේ මළගම වෙනුවෙන් පැමැණ සිටි පිරිස දැකීමෙන්. මිනි සුන්ට මේ තරම් අකෘතඥ විය හැකිද? ලෙඩ ඇඳේ සිටියදීත් පෑන අත්නොහළ මේ මිනිසාගේ අවසාන මොහොත වෙනුවෙන් නිසි ගෞරවයක් දක්වන්නට අපේ මිනිසුන්ට නොහැකි වුණේ මන්ද?

යන්තමින් හරි මගේ සතුටට හේතු වුණේ ඔහුගේ සෑම සාහිත්‍ය කටයුත්තකදීම සහභාගි වන පිරිස අවසාන මොහොත දක්වාම ඔහුව අත් නොහැර සිටිනවා දැකීමෙනුයි.
අපේ මිනිසුන් මේ ප්‍රවීණයා වැන්නවුන් සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් කරන දායකත්වය දෙස මෙයට වඩා සාධාරණ ඇසකින් බැලීමට පුරුදුවන්නේ කවදාද?

ලෝකය බොහෝ වෙනස් වෙලා තියෙනවා. සිය ගාණක් සිංහල පොත් ඇති ඩැංඩිනොන් නගර සභා පුස්තකාලයේ රාක්ක සියල්ල හිස්. සේරම සිංහල පොත් පාඨකයන් ඇරගෙන ගිහින්. මිනිස්සු පොත් බලනවා මාර විදිහට. ඒත් කවුරුත් කියවන පාටක් නැහැ. කියවීම විදීම කියන්නෙ වෙනස් හැගීමකින් ඇති විය යුත්තක්. ඒක මිනිසුන් තුළ ගොඩ නගන්න තමයි කුරුප්පු අංකල්ලා වගේ මිනිස්සු ජීවිත කාලයක් පුරා කැපවුණේ. දුකයි.. චූටි මල්ලිට බොහොම දුකයි. මරණයට ඇවිත් හිටිය තුන්සීයක් පමණ පිරිසට චූටි මල්ලිගෙ ආචාරය.

## මල් හතයි

දැන් දැන් වික්ටෝරියා ප්‍රාන්තේ පුරාම කව්බෝයිස්ලා ගැන අහන්න ලැබෙනවා නිතරම. පොඩ්ඩක් එහෙ මෙහෙ උනොත්



ඇදලා ගත්තා තියලා දැම්මා. පහුගිය දවස් වල පත්තර ටීවී ප්‍රවෘත්ති චෙක් කරලා බලන්න වෙඩි තබා ගැනීම් කීයක් නම් වර්තා වෙලා තියෙනවද කියලා. එහෙම නැත්නම් පිහි ඇනුම්. කට්ටියට කියන්නේ මොනවා හරි ගේමකට අතර මගදී කොටු වුණොත් කල්පනාවෙන් ඉවසීමෙන් වැඩ කරන්න කියන එකයි. මිනිස්සු ඉන්නේ ප්‍රශ්න මැද. ආසියානුවෝ මේ වගේ වැඩ වලට තාම නැති වුණත් පරිස්සමින්.

පොඩි පොඩි සීන්ස් තිබුණත් ඔස්ට්‍රේලියාවේ නීතිය නම් ලොක්කා මාරයි. නීතිය ක්‍රියාත්මක වීම මාරයි. අදහන්න වටිනවා. නීතියේ සාධාරණත්වය සැමට එක හා සමා-



නයි.

ජාතිබේද
ආගම් බේද
උස්මිටි කම්
කිසිම දෙයක් අදාල
නැහැ. වැරැද්දට දඬුවම නියතයි. ඔය තියෙන්නේ ගෙඩි පිටින්ම කාදිනලුත් අහුවෙලා. වැරදි වලට කාලය අදාල නැහැ. ගොනා පසුපස එන ගැල වගේ. ඔස්ට්‍රේලියාවේ නීතියට මල් මිටක් මගෙන්..

## අපි පව් අප්පා...

පසුගිය දවස් වල සීගීත ප්‍රසංග ඔක්කාර යන සයිස් එකට තිබුණා. අපි හැමදාම කියන්නා වගේ තොග පිටින් මෙහේ එනකොට අපි කොහොමද රස විඳින්නේ? එන කට්ටියත් දැන් දැන් අපිට දෙන්නේ රසය නෙවෙයි. ආතල්.. එන කට්ටියටත් දැන් මෙහේ ඇවිල්ලම ඇති වෙලා වගෙයි. මට හිතෙන්නෙ ඒ අය හිතන්නෙ "මුන්ට කොහොම කිව්වත්ගානක් නැහැ" කියලා වගෙයි. ඒ සයිස් එකෙන් තමයි ගේම යන්නෙ. එක



අතකට ඒ මිනිස්සුත් අමාරුවෙන් ලංකාවේ ඉන්නෙ. ඒ නිසාම ඒ අය පිං අතේ වැඩක් කියලා හිතන් වගේ ඇවිත් ඔහේ එන එන සැරේට ගිහින් සින්දුත් අහලා කට්ටියගේ බයිලත් අහලා එනවා. රසික අපි පව් අප්පා..

## ඉංගිරිසි....? ඕනෙමයි සහෝ

දැං මේ ආදි ශිෂ්‍ය සංගම් වලින් හෙන ග්‍රෑන්ඩ් එකට කරන උත්සව වලට මොකද සිංහලෙන් කතා කරන නිවේදකයන් ගන්නෙ නැත්තෙ? පහුගිය දවස් වල මෙහේ තිබුණ ඒ වගේ උත්සව කීපයකටම ගියා. හැම තැනම වැඩේ පටන් ගන්නෙ ඉංග්‍රීසියෙන්. විස්තර ඔක්කොම ඉංග්‍රීසියෙන්. ඊට පස්සෙ අර චොර පාටි එකට එනකොට සිංහල එනවා. සිංදුත් සිංහලෙන්. වාද විවාදත් සිංහලෙන්. එනඑවුන් කියන්නෙ නටන්න බයිලා. ඒවත් සිංහලෙන්. අර වැඩේ පටන් ගන්න විස්තර කරන්න විතරක් ඉංග්‍රීසි ගාවනව. ඒ ටිකත් සිංහලෙන් කළාම ඉවරනෙ. එහෙම නැත්නම් ඕනෙම නම් භාෂා දෙනෙන්ම කළා නම් ඉවරයිනෙ. මේක මාර මානසිකත්වයක්. එක අතකට ඔය ටයි කෝට් ඇඳල යන එක වගේ පොඩි ඉංග්‍රීසි පාටි එකකුත් තියෙන්න එපායැ.

පව් නේ මේවා කියන මං..

**චූටි මල්ලි**